# බ්‍රහස්පතින්දා

## පළමුවන කියැවීම

එස්තර්ගේ පොතේ සඳහන් වන එස්තර්ගේ යැදුමෙන් කොටසකි.

එස්තර් (ද්.ස.ග්‍ර.) 4:17

**සමිඳුනි, ඔබ හැර අන් උදව්කරුවකු මට නැත.**

එස්තර් බිසව තමාට හදිසියෙන් සිදුවන්නට තිබුණු මරණ අන්තරාවෙහි දී සමිඳාණන්ගේ සරණය සෙව්වාය. ඇය ඉශ්රායෙල්වරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේට බැගෑපත්ව යාච්ඤා කරමින් මෙසේ කීවාය.

"මා සමිඳුනි, අප රජිඳුනි, ඔබ එකම තැනැන් වහන්සේ ය. මා සහායට වැඩිය මැනව. මම තනි වී සිටිමි. ඔබ හැර අන් උදව්කරුවකු මට නැත. මා දිවියට හානි කිරීමට මම යමි. සමිඳුන් වන ඔබ සියලු ජාතීන් අතරෙන් ඉශ්රායෙල්වරුන් ද පැරණි ජනයා අතරෙන් අපේ පියවරුන් ද ඔබේ සදා උරුමය වන පිණිස තෝරාගත් බව මම බාල වියෙහි දී මාගේ පවුලේ තුරුල්ලෙහි දී ම ඉගෙන ගතිමි. ඔබ පොරොන්දු වූ පරිදි ඔබ ඔවුන් සැලකුවෙහි ය. සමිඳුනි, අපේ විපත් දවසේ දී අප සිහි කළ මැනව. ඔබ ප්‍රශංසා කරගනු මැනව. දේවාති දෙවියනි, සව් බලැති සමිඳුනි, මා දිරිගැන්වුව මැනව. මා සිංහයාට මුණ පානවිට මා මුවෙහි සිත් ගැන්මෙහි සමත් වදන් තැබුව මැනව. අපේ සතුරා ද ඔහු වැනි අනෙක් අය ද වැනසෙන පිණිස ඔහුගේ හෘදය තුළ අපේ සතුරාට විරුද්ධව වෛරයක් ඇති කළ මැනව. ඔබේ හස්තයෙන් අප ගළවාලුව මැනව. සමිඳුනි, මා

තනිව සිටින හෙයින් ද ඔබ හැර අන් කිසිවකු මට නැති හෙයින් ද මාගේ සහයට වැඩිය මැනව.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 138 : 1–3, 7–8

පිළිතුරු: මා ඔබ යැදූ කල ඔබ වහන්සේ මට පිළිතුරු දුන් සේක.

ගීය:

සමිඳුනි, හද පත්ලෙන් ඔබට තුති කරන්නෙමි. දෙවිවරුන් ඉදිරියෙහි ඔබට ගීගයා ඔබ පසසන්නමි.
ඔබේ ශුද්ධ මාලිගාව දෙස බලා නමස්කාර කරමින් ඔබේ කරුණා ගුණය සහ සත් ගුණය නිසා ඔබේ නාමයට තුති පුදන්නෙමි. ඔබේ නාමයත්, ආඥාත් උත්තරීතර බව ඔබ පෙන්වූ සේක.

මා ඔබ යැදි දවසේ දී ඔබ මට පිළිතුරු දුන් සේක. මාගේ සිත සවි කොට, මට ධෛර්යය දුන් සේක. මම විපත්ති මැද හැසිරෙමි, නමුත් ඔබ මා රැකබලා ගන්න සේක. ඔබ මාගේ සතුරන්ගේ උදහසට විරුද්ධව ඔබේ හස්තය දිගු කරන සේක.

ඔබේ සුරතින් ඔබ මා ගළවන සේක. සමිඳාණෝ මා සම්බන්ධව අදහස් කරන දේ ඉටු කරන සේක. සමිඳුනි, ඔබේ ප්‍රේමය සදා පවත්නේය. ඔබ ඇරඹූ දේ නිම කළ මැනව.

## සාධුකාරය

"උපවාසයෙන් ද, වැළපීමෙන් ද මුළු සිතින් දැන්වත් මා වෙත හැරී එන්න."

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 7 : 7-12

### *ඉල්ලන්න ඔබට දෙනු ලැබේ.*

"ඉල්ලන්න ඔබට දෙනු ලැබේ. සොයන්න ඔබට සම්බ වේ. තට්ටු කරන්න ඔබට දොර අරිනු ලැබේ. මන්ද ඉල්ලන්නාට ලැබේ. සොයන්නාට සම්බ වේ. තට්ටු කරන්නාට දොර අරිනු ලැබේ. ඔබ අතරෙන් කවර මනුෂ්‍යයෙක් හෝ තමාගේ පුත්‍රයා පාන් ගෙඩියක් ඉල්ලුවොත් ඔහුට ගල් ගෙඩියක් දෙයි ද? මාළුවෙකු ඉල්ලුවොත් සර්පයෙකු දෙයි ද? මෙසේ අයහපත් ඔබ ඔබේ දරුවන්ට යහපත් දේ දෙන්නට දන්නහු නම් ස්වර්ගයෙහි සිටින ඔබේ පියාණන් වහන්සේ තමන්ගෙන් ඉල්ලන්නන්ට යහපත් දේ ඊටත් වැඩියෙන් නොදෙන සේක් ද?

අනුන් යමක් ඔබට කරනවාට ඔබ කැමතිද? ඔබත් ඒ දේ ම ඔවුන්ටත් කරන්න. ව්‍යවස්ථාවලියේ හා දිවැසාවලියේ හරය එය වේ."

**සුවිශේෂ වාක්‍යය එසේ ය.**